**ශීර්ෂය 145 - බන්ධනාගාර ප්‍රතිසංස්කරණ, පුනරුත්ථාපන, නැවත පදිංචි කිරීම් හා හින්දු ආගමික කටයුතු අමාත්‍යාංශය පිළිබඳ විගණකාධිපති වාර්තාව 2015 වර්ෂය**

**------------------------------------------------------------------------------------------------------------**

ශීර්ෂය 145 - අමාත්‍යාංශයේ 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය වාර්තා, පොත් පත්, ලේඛන හා අනෙකුත් වාර්තා අන්තර්ගත වූ විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව 2016 අගෝස්තු 08 දින අමාත්‍යාංශයේ ලේකම්වරයා වෙත නිකුත් කරන ලදී. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයා ගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

**1.2 ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම**

**------------------------------------------------------------------------------------**

විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148, 149,150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රාජ්‍ය මූල්‍ය හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වා ගෙන යාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන අභ්‍යන්තර පාලනයන් සැලැසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම හා පවත්වා ගෙන යාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

**2. ගිණුම්**

**-------**

**2.1 විසර්ජන ගිණුම**

**----------------**

**(අ) මුළු ප්‍රතිපාදනය හා වියදම**

**----------------------------**

අමාත්‍යාංශය සඳහා සලසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනය රු.මිලියන 6,806.53 ක් වූ අතර සමාලෝචිත වර්ෂය අවසාන වන විට ඉන් රු.මිලියන 1,937.53 ක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව අමාත්‍යාංශය වෙත සලසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනයෙන් රු.මිලියන 4,869.00 ක් හෙවත් සියයට 71.53 ක ප්‍රතිපාදන ඉතිරි වී තිබුණි. විස්තර පහත දැක්වේ.

| **වියදම** | **2015 දෙසැම්බර් 31 දිනට** | | | **ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස** |
|---|---|---|---|---|
| | **ශුද්ධ ප්‍රතිපාදනය** | **උපයෝජනය** | **ඉතිරිය** | |
| | **රු.මිලියන** | **රු.මිලියන** | **රු.මිලියන** | |
| පුනරාවර්තන | 830.11 | 822.62 | 7.49 | 0.90 |
| මූලධන | 5,976.42 | 1,114.91 | 4,861.51 | 81.34 |
| **එකතුව** | **6,806.53** | **1,937.53** | **4,869.00** | **71.53** |

**2.2 අත්තිකාරම් ගිණුම**

**2.2.1 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම**

**පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන්**

අමාත්‍යාංශයට අදාළ විෂය අංක 14501 යටතේ රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම වෙනුවෙන් පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන් හා තථ්‍ය අගයන් පහත දැක්වේ .

| වියදම | | ලැබීම් | | හර ශේෂය | |
|---|---|---|---|---|---|
| උපරිම සීමාව | තථ්‍ය | අවම සීමාව | තථ්‍ය | උපරිම සීමාව | තථ්‍ය |
| රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන |
| 11.12 | 2.91 | 2.00 | 2.90 | 37.50 | 8.58 |

**2.3 අග්‍රිම ගිණුම**

අමාත්‍යාංශය යටතේ වූ අංක 7002/0000/00/0377/0014/000 දරන අග්‍රිම ගිණුමේ 2015 දෙසැම්බර් 31 දිනට ශේෂය රු.8,088 ක් වී තිබුණි.

**2.4 පොදු තැන්පත් ගිණුම්**

අමාත්‍යාංශය යටතේ වන තැන්පත් ගිණුම් 03 ක 2015 දෙසැම්බර් 31 දිනට ශේෂ එකතුව රු.5,767,928 ක් විය. විස්තර පහත දැක්වේ.

| තැන්පත් ගිණුම් අංකය | 2015 දෙසැම්බර් 31 දිනට ශේෂය |
|---|---|
| | රු. |
| 6000/0000/00/0001/0079/000 | 35,269 |
| 6000/0000/00/0016/0055/000 | 5,692,334 |
| 6000/0000/00/0018/0066/000 | 40,325 |
| එකතුව | **5,767,928** |

**2.5 විගණන නිරීක්ෂණය.**

බන්ධනාගාර ප්‍රතිසංස්කරණ, පුනරුත්ථාපන, නැවත පදිංචි කිරීම් හා හින්දු ආගමික කටයුතු අමාත්‍යාංශයේ 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ඉහත 1.1 ඡේදයේ දක්වා ඇති කළමනාකරණ විගණන වාර්තාවේ සඳහන් විගණන නිරීක්ෂණවලට යටත්ව සතුටුදායක ලෙස

පිළියෙල කර තිබුණි. එම කළමනාකරණ විගණන වාර්තාවේ ඇතුළත් විගණන නිරීක්ෂණවලින් ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ 3 ඡේදයේ සඳහන් කර ඇත.

## 3. ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ

### 3.1 ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම

අමාත්‍යාංශය විසින් පහත දැක්වෙන ඇතැම් ලේඛන පවත්වා නොතිබුණු අතර ඇතැම් ලේඛන විධිමත්ව හා යාවත්කාලීනව පවත්වා නොතිබුණු බව නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය විය.

| | ලේඛන වර්ගය | අදාළ රෙගුලාසිය | නිරීක්ෂණ |
|---|---|---|---|
| (i) | පරිගණක, උපාංග හා මෘදුකාංග පිළිබඳ ස්ථාවර වත්කම් ලේඛනය | 2002 නොවැම්බර් 28 දිනැති අංක IAI/2002/02 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය | පවත්වා නොතිබුණි. |
| (ii) | බැරකම් ලේඛනය | මුදල් රෙගුලාසි 214 | පවත්වා නොතිබුණි |
| (iii) | උප පත්‍රිකා පොත් ලේඛනය | මුදල් රෙගුලාසි 341 | පවත්වා නොතිබුණි |
| (iv) | ස්ථාවර වත්කම් ලේඛනය | 1978 දෙසැම්බර් 19 දිනැති අංක 842 භාණ්ඩාගාර චක්‍රලේඛය | යාවත්කාලීන කර නොතිබුණි |
| (v) | සුළු මුදල් පොත | මුදල් රෙගුලාසි 446 | යාවත්කාලීන කර නොතිබුණි. |
| (vi) | වාහන ලොග් පොත | මුදල් රෙගුලාසි 1645(අ) | යාවත්කාලීන කර නොතිබුණි |

### 3.2 විගණන විමසුම්වලට පිළිතුරුදීම

අමාත්‍යාංශය වෙත සමාලෝචිත වර්ෂයේදී ඉදිරිපත් කරන ලද විගණන විමසුම් 06 කට 2016 මාර්තු 31 දින වන විටත් පිළිතුරු ඉදිරිපත් කර නොතිබුණි. එම විමසුම්වලට අදාළ ගණනය කළ හැකි ගනුදෙනුවල වටිනාකම රු. 70,136,245 ක් වී තිබුණි.

### 3.3 තත්කාර්ය අතුරු අග්‍රිම ලබාදීම

2015 ජුලි 14 දිනැති අංක 03/2015 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයෙන් සංශෝධිත මුදල් රෙගුලාසි 371(2) හි සඳහන් විධිවිධානයන්ට පටහැනි ලෙස මාණ්ඩලික නොවන නිලධාරීන් 05 කට අවස්ථා 45 කදී එකතුව රු. 774,855 ක තත්කාර්ය අතුරු අග්‍රිම නිකුත් කර තිබුණි.

## 3.4 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම

-----------------------------------------

විෂය අංක 14501 දරන රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ 2015 දෙසැම්බර් 31 දිනට වූ සැසඳුම් ප්‍රකාශය සම්බන්ධයෙන් සිදුකළ නියැදි විගණන පරීක්ෂාවේදී පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

(අ) විගණනයට ඉදිරිපත් කළ සැසඳුම් ප්‍රකාශය ප්‍රකාරව එදිනට අයවීම් හිඟහිට තිබුණු ශේෂවල එකතුව රු. 376,166 ක් වූ අතර, එම හිඟහිටි ශේෂ වර්ෂ 1 ක සිට වර්ෂ 5 ක් දක්වා කාල පරාසයක් සිට පැවැත එමින් තිබුණත්, එම හිඟහිටි ණය ශේෂ අයකර ගැනීමේ පසුවිපරම් කටයුතු දුර්වල තත්ත්වයක පැවැතුණි.

(ආ) 2015 දෙසැම්බර් 31 දිනට නිලධාරීන් සිව් දෙනෙකුගේ හිඟහිටි ණය ශේෂවල එකතුව රු.376,166 ක් අයකර ගැනීමට අපොහොසත් වී තිබුණි. මේ අතුරින් සේවය හැර ගිය නිලධාරීන් දෙදෙනෙකුගෙන් එකතුව රු.221,066 ක ණය ශේෂද, වැඩ තහනම් කළ නිලධාරීන් දෙදෙනෙකුගෙන් රු.155,100 ක මුදලක්ද හිඟහිට තිබුණි.

## 3.5 යහපාලනය හා ගිණුම් කටයුතුභාවය

---------------------------------------

**වාර්ෂික කාර්යසාධන වාර්තාව**

--------------------------------

2002 සැප්තැම්බර් 12 දිනැති අංක 402 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව අමාත්‍යාංශය විසින් මුදල් වර්ෂය අවසාන වී දින 150 ක් ඇතුළත කාර්යසාධන වාර්තාව පාර්ලිමේන්තුවේ සභාගත කළ යුතු වුවත්, එම වාර්තාව 2016 ජුනි 30 දින වන විටත් පාර්ලිමේන්තුවේ සභාගත කර නොතිබුණි.

## 3.6 බේරුම් නොකළ බැරකම්

---------------------------

අමාත්‍යාංශය විසින් 2015දෙසැම්බර් 31 දිනට බේරුම් නොකළ බැරකම්වල එකතුව රු.1,816,009ක් වී තිබුණි.

## 3.7 අනුකූල නොවීම්

-----------------

**නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම**

-----------------------------------------------

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

| නීති, රීති හා රෙගුලාසිවලට යොමුව | | වටිනාකම | අනුකූල නොවීම |
|---|---|---|---|
| | | රු | |
| **(අ)** | **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය** | | |
| | (i) මුදල් රෙගුලාසි 447(4) හා (5) | 1,816,009 | විසර්ජන සම්මත වැය ලෙජයේ වියදම් ඇතුළත් කර නොතිබුණි. |
| | (ii) මුදල් රෙගුලාසි 94(1) | 613,436 | වැය විෂය 11ක ඉතිරිවීම් ඉක්මවා බැරකම්වලට එළඹ තිබුණි. |
| | (iii) මුදල් රෙගුලාසි 103, 104 හා 156 | 110,000 | රාජ්‍ය දේපල අලාභයට සම්බන්ධ වගකිව යුතු නිලධාරින් නිශ්චය කර මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. |
| | (iv) මුදල් රෙගුලාසි371-373 | 290,000 | තත් කාර්ය අතුරු අග්‍රිම සීමා ඉක්මවා අග්‍රිම ලබා ගැනීම |
| | (v) මුදල් රෙගුලාසි371(2) | 774,885 | මාණ්ඩලික නොවන නිලධාරින් වෙත තත් කාර්ය අතුරු අග්‍රිම ලබා දීම. |
| **(ආ)** | **රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ** | | |
| | 2008 ජුනි 26 දිනැති අංක 114/2008 දරන චක්‍රලේඛය | 338,006 | නිල වාහනයට අමතරව සංචිත වාහන පරිහරණය හා රියදුරුගේ පෞද්ගලික භාවිතයට යතුරු පැදියක් ලබා දීම. |

**3.8 කාර්යසාධනය**

----------------

**පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.**

**(අ)** වැය විෂයයන් 07 ක් සඳහා මුල්‍යකරණ 13 හා 17 යටතේ සලසා තිබුණු රු.4,847,350,000 ක ප්‍රතිපාදනවලින් සියයට 4ක් එනම් රු. 208,098,995 ක් පමණක් උපයෝජනය කර තිබුණු අතර ප්‍රතිපාදනවලින් සියයට 96 ක් එනම් රු.4,639,251,005 ක ප්‍රතිපාදන ඉතිරිව තිබුණි.

මේ සම්බන්ධව පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) ඉන්දියානු රජය විසින් සෘජුවම ශ්‍රී ලංකා ඉන්දියානු තානාපති කාර්යාල වෙත අරමුදල් ලබා දීමෙන් ක්‍රියාත්මක කරනු ලබන නිවාස ව්‍යාපෘතියක් සඳහා සමාලෝචිත වර්ෂයේදී අමාත්‍යාංශ වැය විෂයයක් යටතේ මුල්‍යකරණ 13 හා 17 මගින් රු.මිලියන 4,492 ක ප්‍රතිපාදන සලසා තිබුණි. එම ප්‍රතිපාදනය උපයෝජනය නොකිරීම නිසා සම්පූර්ණ ප්‍රතිපාදනයම ඉතිරි වී තිබුණි. එක් නිවාසක වියදම රු.550,000 ක් වූ, ඉදිකළ යුතු නිවාස 46,000 කින්, නිවාස 42,839ක වැඩ කොටස් ඉකුත් වර්ෂයේ සලසා තිබුණු ප්‍රතිපාදන උපයෝජනය කර අවසන් කර තිබුණු බව 2016 මැයි 19 දින අමාත්‍යාංශයේ ලේකම්වරයා විසින් විදේශ කටයුතු අමාත්‍යාංශයේ ලේකම්වරයා වෙත යවන ලද ලිපියකින් වාර්තා කර තිබුණි.

(ii) වැය විෂයයක් යටතේ නිවාස ඉදිකිරීම සඳහා මුල්‍යකරණ 13 හා 17 යටතේ විෂයයක් සඳහා රු. මිලියන 57 ක ප්‍රතිපාදන සලසා තිබුණත්, ගිවිසුම් අත්සන් නොකිරීම හේතුවෙන් එම සම්පූර්ණ ප්‍රතිපාදනයම ඉතිරි කර තිබුණි.

(iii) බිම් බෝම්බ අවදානම පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන (යුනිසෙෆ්) සඳහා මුල්‍යකරණ 13 මගින් වැය විෂයයක් සඳහා රු.904,000 ක ප්‍රතිපාදන සලසා තිබුණි. භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවෙන් අග්‍රිම නොලැබීම නිසා එම වැඩසටහන ක්‍රියාත්මක කර නොතිබුණි.

(iv) වැය විෂයයන් 03 ක් සඳහා මුල්‍යකරණ 13 හා 17 මගින් ප්‍රතිපාදන කර තිබුණු රු. 295,350,000 ක ප්‍රතිපාදන උපයෝජනයට අදාළව 2015 සැප්තැම්බර් 20 දිනට එහි මුල්‍ය හා භෞතික කාර්යසාධනය පිළිබඳව තොරතුරු අමාත්‍යාංශයේ ලේකම්වරයා විසින් ජනාධිපති ලේකම්වරයා වෙත යවා තිබුණි. එම තොරතුරු අනුව සලසා තිබුණු ප්‍රතිපාදනයෙන් සියයට 28 ක් වූ රු.82,400,000 ක උපයෝජනයකට අදාළ නිවාසවල අත්තිවාරම් දැමීම හා බිත්ති සම්පූර්ණ කිරීම දක්වා පමණක් එහි ප්‍රගතිය අඩු මට්ටමක පැවති බව හා වැඩ ආරම්භ කර තිබුණු නිවාස ගණන කොපමණද යන්න වාර්තා කර නොතිබුණි.

(ආ) අමාත්‍යාංශයේ සංවර්ධන වැඩ සටහන් යටතේ මුල්‍යකරණ 13 හා 17 යටතේ සලසා තිබුණු රු.4,847,350,000 ක ප්‍රතිපාදනද ඇතුලුව අමාත්‍යාංශය සඳහා නිවාස සහ විවිධ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමට ලබාදී තිබුණු මුළු ප්‍රාග්ධන ප්‍රතිපාදනය වූ රු.5,454,368,000 කට අදාළව මුල්‍ය හා භෞතික කාර්යසාධන වාර්තා ගෙන්වා ගැනීම, ඒවායේ ප්‍රගතිය පරීක්ෂා කිරීම, ඒ සඳහා ක්‍රියාමාර්ග ගැනීම හෝ එම ව්‍යාපෘති ඇගයීමක් අමාත්‍යාංශය විසින් සිදුකර නොතිබුණි.

(ඇ) තල් සංවර්ධන මණ්ඩලයේ පර්යේෂණ ආයතනය නැවත ස්ථාපිත කිරීම සඳහා සලසා තිබුණු ප්‍රතිපාදනයෙන් රු.4,000,000 ක ප්‍රතිපාදන ඉතිරි වී තිබුණි. එම ප්‍රතිපාදන අරමුණු ගත කාර්යය සඳහා යෙදවීමට අවශ්‍ය ක්‍රියාමාර්ග අමාත්‍යාංශය විසින් ගෙන නොතිබුණි.

**3.9 මතභේදයට තුඩුදෙන ගනුදෙනු**

**--------------------------------**

මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) **අමාත්‍යාංශය සඳහා ගොඩනැගිල්ලක් කුලියට ගැනීම.**

**----------------------------------------------------------**

අමාත්‍යාංශයේ ප්‍රයෝජනය සඳහා බාහිර පාර්ශවයකින් ගොඩනැගිල්ලක් 2016 මැයි 10 දින සිට 2018 මැයි 09 දින දක්වා කුලියට ගැනීම සඳහා 2016 අප්‍රේල් 11 දින ගිවිසුම් අත්සන් කර ඒ සඳහා මාසික කුලී තක්සේරුව රු.4,200,000ක් ගෙවීමට එකඟ වී තිබුණි. මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) ඇගයීම් කමිටු වාර්තාවෙන් නිර්දේශ කර තිබුණු අවම මිල ඉදිරිපත් කර තිබුණු හා දෙවන අවම මිල ඉදිරිපත් කර තිබුණු ගොඩනැගිල්ල නොසලකා තෙවන අවම මිල ඉදිරිපත් කර තිබුණු ගොඩනැගිල්ල කුලී පදනම මත ලබා ගෙන තිබුණි. අමාත්‍යාංශයේ ලේකම්වරයා සඳහා ප්‍රසම්පාදන කමිටු දෙකක් පත් කර තිබුණි. ඉහත දක්වා ඇති ඇගයීම් කමිටු නිර්දේශය පළමු ප්‍රසම්පාදන කමිටුව අනුමත කර තිබුණු අතර, පසුව පත් කරන ලද ප්‍රසම්පාදන කමිටුව විසින් තෙවන අවම මිල ඉදිරිපත් කර තිබුණු ගොඩනැගිල්ල රු.4,200,000 ක කුලියට ගැනීමට පසුව අනුමත කර තිබුණි.

(ii) ගොඩනැගිල්ල කුලී පදනම මත ලබා ගැනීම සඳහා රජයේ ප්‍රධාන තක්සේරුකරු විසින් වර්ග අඩියක් රු.85 ක් බැගින් රු.3,000,000 කට, ගිවිසුම අත්සන් කරන ලද ගොඩනැගිල්ල තක්සේරු කර තිබුණි. ගොඩනැගිල්ල රු.3,000,000 කට ලබාදීම සඳහා අයිතිකරු එකගතාවයක් පල නොකර ඇති බැවින් වෙළඳපොල කුලී වටිනාකම අනුව තක්සේරුවක් ලබා දෙන මෙන් අමාත්‍යාංශ ලේකම්වරයා 2016 ජනවාරි 25 දිනැති ලිපියෙන් රජයේ ප්‍රධාන තක්සේරුකරුගෙන් ඉල්ලා තිබුණි. ඒ අනුව රජයේ ප්‍රධාන තක්සේරුකරු විසින් මෙම කරුණ සමථයකට පත්කර ගැනීම සඳහා වාර්ෂික කුලිය රු.4,200,000 කට තක්සේරු කර ඇති බව, ඔහුගේ 2016 පෙබරවාරි 01 දිනැති පිළිතුරු ලිපියෙන් දන්වා තිබුණි.

**(ආ) කූට ලේඛන ඉදිරිපත් කර මුදල් වංචා කිරිම**

**---------------------------------------------**

සාවද්‍ය බිල්පත් කූට ලේඛන ඉදිරිපත් කර රු.592,108 ක් වංචා කිරීම සම්බන්ධව 2015 ජුලි 24 දිනැති අංක LS/E/MTISED/2015/AQ01 දරන විගණන විමසුමේ සඳහන් නිරීක්ෂණ ගැඹුරින් පරික්ෂා කිරීම සඳහා අමාත්‍යාංශ ලේකම් විසින් ත්‍රිපුද්ගල කමිටුවක් පත් කර තිබුණි. එම කමිටුවේ වාර්තාව 2015 ඔක්තෝබර් 30 දින අමාත්‍යාංශ ලේකම්වරයා වෙත ඉදිරිපත් කර තිබුණද, එහි නිර්දේශ ක්‍රියාමත්මක කර නොතිබුණි.

**(ඇ) තල් සංවර්ධන මණ්ඩලයට ලබා දී තිබුණු ප්‍රතිපාදන**

**-----------------------------------------------------------**

තල් සංවර්ධන මණ්ඩලය වෙත 2015 වර්ෂයේදී ලබා දී තිබුණු රු.මිලියන 60 ක ප්‍රතිපාදන සම්බන්ධව පරීක්ෂා කර විගණකාධිපති වෙත වාර්තාව ඉදිරිපත් කිරීම සඳහා අමාත්‍යාංශ ලේකම්වරයා විසින් 2015 ඔක්තෝබර් 12 දින කමිටුවක් පත්කර තිබුණි. එම කමිටුවේ වාර්තාව සති 02 ක් ඇතුළත අමාත්‍යාංශ ලේකම්වරයා වෙත යොමු කරන ලෙස දන්වා තිබුණද, එම වාර්තාව 2015 දෙසැම්බර් 31 දින වන විටත් ඉදිරිපත් කර නොතිබුණි.

**3.10 මානව සම්පත් කළමනාකරණය**

**------------------------------------**

**අනුමත සේවක සංඛ්‍යාව හා තථ්‍ය සේවක සංඛ්‍යාව**

**----------------------------------------------------------**

2015 දෙසැම්බර් 31 දිනට වූ සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදි විය.

| | **සේවක වර්ගය** | **අනුමත සේවක සංඛ්‍යාව** | **තථ්‍ය සේවක සංඛ්‍යාව** | **පුරප්පාඩු සංඛ්‍යාව** |
|---|---|---|---|---|
| (i) | ජ්‍යෙෂ්ඨ මට්ටම | 19 | 13 | 06 |
| (ii) | තෘතියික මට්ටම | 06 | 03 | 03 |
| (iii) | ද්විතියික මට්ටම | 87 | 70 | 17 |
| (iv) | ප්‍රාථමික මට්ටම | 29 | 26 | 03 |
| (v) | වෙනත් (අනියම්/ තාවකාලික / කොන්ත්‍රාත් පදනම) | 04 | 04 | - |
| | **එකතුව** | **145** | **116** | **29** |

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

සමාලෝචිත වර්ෂය අවසාන වන විට පුරප්පාඩු 29 ක් පැවැතී තිබුණත්, 2015 වර්ෂය වෙනුවෙන් පිළියෙල කර තිබුණු විසර්ජන ගිණුම අනුව සලසා තිබුණු ප්‍රතිපාදන උපයෝජනය නොකර ඉතිරි වී තිබුණත්, එම ඉතිරියන් කෙරෙහි කාර්ය මණ්ඩල පුරප්පාඩු පැවැතීම බලපා නොතිබුණි.